# ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

## 2024 වර්ෂය සඳහා වන ප්‍රගති වාර්තාව
## වැය ශීර්ෂ අංකය 024

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, අංක. 44, ආර්.ජී. සේනානායක මාවත, කොළඹ 07
දුරකතන: 011-2665152 - ෆැක්ස්: 011-2665162 - විද්‍යුත් ලිපිනය: sg@nprocom.gov.lk

# අන්තර්ගතය

පිටු අංකය


**1** වන පරිච්ඡේදය ........ **1**

**1.1** ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිහිටුවීම ........ **1**

**1.2** ආයතනයේ දැක්ම, මෙහෙවර සහ පරමාර්ථ ........ **1**

**1.3** ප්‍රධාන කාර්යයන් ........ **1**

**1.4** ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අංශ ........ **3**

**2** වන පරිච්ඡේදය ........ **5**

**2.1** පරිපාලන අංශය ........ **5**

**2.2** පරිපාලන අංශයේ ප්‍රගතිය ........ **5**

**2.2.1** ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය ........ 5

**2.2.2** කොමිෂන් සභාවට පත් කරන ලද / අනුයුක්ත කරන ලද නිලධාරීන් - **2024** ........ 6

**2.2.3** මානව සම්පත් සංවර්ධනය ........ 7

**2.2.4** කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩමුළු සහ පුහුණු වැඩසටහන් - **2024** ........ 9

**2.3** මූල්‍ය අංශය ........ **9**

**3** වන පරිච්ඡේදය ........ **11**

**3.1** ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශය ........ **11**

**3.2** ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශයේ ප්‍රගතිය ........ **11**

**3.3** ධාරිතා වර්ධනය ........ **13**

**4** වන පරිච්ඡේදය ........ **25**

**4.1** ප්‍රසම්පාදන අධීක්ෂණ අංශය ........ **25**

**4.2** ප්‍රසම්පාදන අධීක්ෂණ අංශයේ ප්‍රගතිය ........ **25**

**4.3** සිදු කෙරෙමින් පවතින කාර්යයන් ........ **26**

**4.4** අභියෝග ........ **26**

**4.5** ඉලක්ක ........ **26**

**4.6** ප්‍රගති සාරාංශය ........ **27**

**5** වන පරිච්ඡේදය ........ **29**

**5.1** ප්‍රසම්පාදන විමර්ශන අංශය ........ **29**

**5.2** ප්‍රසම්පාදන විමර්ශන අංශයේ ප්‍රගතිය ........ **29**

රූපසටහන 1 : ජා.ප්‍ර.කො.ස. සංවිධාන ව්‍යුහය ..................................................................................... 3

වගුව: 1 - 2024/12/31 දින ට ජා.ප්‍ර.කො.ස. සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර ....................................................... 5
වගුව: 2 - ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව - 2024.12.31 දිනට කාර්ය මණ්ඩල වාර්තාව .............................. 5
වගුව: 3 - 2024 වර්ෂය තුළ කොමිෂන් සභාවට පත් කරන ලද / අනුයුක්ත කරන ලද නිලධාරීන් (ස්ථිර, තාවකාලික, කොන්ත්‍රාත්, වැඩ බලන)............................................................................................................. 6
වගුව: 4 - 2024 වර්ෂය තුළ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩමුළු/ පුහුණු වැඩසටහන් - දේශීය ..... 7
වගුව: 5 - 2024 වර්ෂය තුළ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩමුළු/ පුහුණු වැඩසටහන් - විදේශීය... 9
වගුව: 6 - මූල්‍ය ප්‍රගතිය.......................................................................................................................... 10
වගුව: 7 - ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ ගැටලු, විමසීම් පැහැදිලි කිරීම් හා උපදෙස් සඳහා ,ඉදිරිපත් වූ හා ක්‍රියාකරන ලද ඉල්ලීම් - 2024 .................................................................................................... 14
වගුව: 8 - 2022 සහ 2023 වර්ෂවල පිරිනමන ලද ප්‍රසම්පාදන පිළිබඳ තොරතුරු ................................................ 27
වගුව: 9 - 2024 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලසුම් හා ප්‍රසම්පාදන සැලසුම් පිළිබඳ තොරතුරු.......................... 27
වගුව: 10 - ඩේලි නිවුස් පුවත්පතේ පළවූ ලංසු ආරාධනා / අභිලාෂය පළකිරීමේ ප්‍රකාශ පිළිබඳ තොරතුරු............ 28
වගුව: 11 - ප්‍රසම්පාදන ප්‍රදානය කිරීම් ප්‍රකාශයට පත්කිරීම පිළිබඳ තොරතුරු ..................................................... 28
වගුව: 12 - ප්‍රසම්පාදන විමර්ශන අංශයේ ප්‍රගතිය........................................................................................ 29
වගුව: 13 - විමර්ශන පිළිබඳ තොරතුරු 2024 ................................................................................................ 30

# 1 වන පරිච්ඡේදය

## 1.1 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිහිටුවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIXආ පරිච්ඡේදයේ 156ආ. (1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ.;

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. සුධර්මා කරුණාරත්න මහත්මිය | - | සාමාජික හා සභාපති |
| ඩබ්ලිව්. අයිවන් තිසේරා මහතා | - | සාමාජික |
| ඩී.ඒ.පී. දරණගම මහතා | - | සාමාජික |
| එස්. සුමන්තිරන් මහතා | - | සාමාජික |
| ඒ.ජී.පී.අසංග ගුණවංශ මහතා | - | සාමාජික |

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ පරමාර්ථ

**දැක්ම**

ජාතික සංවර්ධනයට මග කියන ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සකස් කිරීම.

**මෙහෙවර**

මුදලට සරිලන වටිනාකමක් සහතික කිරීම උදෙසා ප්‍රමිතිකරණය, අධීක්ෂණය, විමර්ශනය සහ වාර්තා කිරීම තුළින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සැකසීම.

**පරමාර්ථ**

- අර්ථාන්විත රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම සහ සංවර්ධනය කිරීම.
- රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි පිළිපැදීම සහතික කිරීම.
- ඵලදායී කාර්යසාධන අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි නියුතු නිලධාරීන් සඳහා පිළිගත් පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ප්‍රශස්ථ රාජ්‍ය ප්‍රසම්පාදන මූලධර්මවලට අනුකූලව සේවා සැපයීම ශක්තිමත් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

(අ) රජයේ ආයතන විසින් කරනු ලබන භාන්ඩ, වැඩ, සේවා, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය, පූර්වයෙන් අනුමත වූ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව පිලියෙල කරන ලද ප්‍රසම්පාදන සැලසුම් මත පදනම්ව ඇත්ද යන්න පිළිබඳ නියාමනය කොට උචිත බලධාරීන් වෙත වාර්තා කිරීම;

(ආ) රජයේ ආයතන විසින් භාන්ඩ, වැඩ, සේවා, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා වූ සියලු සුදුසුකම්ලත් ලංසුකරුවන්ට එකී භාන්ඩ, වැඩ, සේවා, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා වූ ලංසු ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියට සහභාගීවීම පිනිස සමාන අවස්ථා ලබා දී ඇත් ද යන්න පිළිබඳ නියාමනය කොට උචිත බලධාරීන් වෙත වාර්තා කිරීම;

(ඇ) රජයේ ආයතනවල භාන්ඩ, වැඩ, සේවා, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ සහ කොන්ත්‍රාත් ලබාදීමේ ක්‍රියාපටිපාටිය සාධාරණ හා විනිවිද පෙනෙන සුලු වන්නේද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධාරීන් වෙත වාර්තා කිරීම;

(ඈ) රජයේ ආයතන විසින් ප්‍රසම්පාදන කමිටුවලට සහ ප්‍රසම්පාදනවලට සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටුවලට පත්කරනු ලබන සාමාජිකයින් යෝග්‍ය පරිදි සුදුසුකම් ලබා ඇත්ද යන්න පිළිබඳව වාර්තා කිරීම;

(ඉ) රජයේ ආයතන විසින් පිලිගත් පටිපාටිවලින් සහ උපමාන වලින් බැහැරව කරන ලද ප්‍රසම්පාදන පිළිබඳ වාර්තා විමර්ශනය කිරීම සහ එකී ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීම; සහ

(ඊ) රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි පිළිබඳව දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම.

එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව විසින් 2023 - 2025 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති අතර, එක් එක් වර්ෂය තුළ අනුගමනය කළ යුතු නිශ්චිත ක්‍රියාකාරකම් විස්තරාත්මකව ලැයිස්තුගත කර ඇත. 2024 වර්ෂය සඳහා අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව 2024.01.01 සිට 2024.12.31 දක්වා කාලය තුළ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් විස්තරාත්මකව මෙම වාර්තාවේ විස්තර කෙරේ.

ක්‍රියාකාරී සැලැස්ම අනුව, රාජ්‍ය ප්‍රසම්පාදනය සඳහා පහත සඳහන් නව මාර්ගෝපදේශ සංග්‍රහයන් සහ අත්පොත් සැකසීමට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව (ජා.ප්‍ර.කො.ස) තීරණය කර ඇත.

- භාණ්ඩ,වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත
- උපදේශාත්මක සේවා සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත
- කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය
- ඖෂධ හා වෛද්‍ය උපකරණ සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ඇ. (1) ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු කරමින්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව 2024 වර්ෂය තුළ දී පවත්වන ලද කොමිෂන් සභා රැස්වීම්, අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ පවත්වන ලද රැස්වීම් සහ වැඩමුළු පිළිබඳ සාරාංශ ගත සංඛ්‍යාත්මක තොරතුරු පහත දැක්වේ.

| මාසය | කොමිෂන් සභා රැස්වීම් සංඛ්‍යාව | රාජ්‍ය ආයතන සමඟ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | වැඩමුළු | එකතුව |
|---|---|---|---|---|
| ජනවාරි | 04 | 06 | - | 10 |
| පෙබරවාරි | 04 | 07 | - | 11 |
| මාර්තු | 03 | 08 | 01 | 12 |
| අප්‍රේල් | 01 | 02 | 01 | 04 |
| මැයි | 04 | 10 | - | 14 |
| ජූනි | 04 | 02 | - | 06 |
| ජූලි | 04 | 04 | - | 08 |
| අගෝස්තු | 05 | 03 | 01 | 09 |
| සැප්තැම්බර් | 02 | 03 | 02 | 07 |
| ඔක්තෝම්බර් | 05 | 08 | - | 13 |
| නොවැම්බර් | 03 | 04 | 07 | 14 |
| දෙසැම්බර් | 03 | 03 | 02 | 08 |
| **සමස්ථ එකතුව** | **42** | **60** | **14** | **116** |

**සංවිධාන සටහන - ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව**




රූපසටහන 1 : ජා.ප්‍ර.කො.ස. සංවිධාන ව්‍යුහය

## 1.4 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අංශ

<u>පාලන හා මූල්‍ය අංශය</u>

ආයතනයේ සාමාන්‍ය පරිපාලනය, ආයතනික කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ජා.ප්‍ර.කො.සභාවේ කාර්යය හා කර්තව්‍ය මනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කාර්යය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. ජා.ප්‍ර.කො.සභා කාර්යාලයේ සියලුම මූල්‍ය, ගිණුම්කරණ සහ ප්‍රසම්පාදන කටයුතු සඳහා ද මෙම අංශය වගකීමෙන් බැඳේ. මීට අමතරව, එය පාර්ලිමේන්තුව, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, ජනාධිපති ලේකම් කාර්යාලය සහ මුදල් අමාත්‍යාංශය ඇතුළු රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු අධීක්ෂණය කරයි. මෙම අංශය විසින් ප්‍රසම්පාදන ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් ජා.ප්‍ර.කො.ස. වෙත යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සහ වාර්තා ඉදිරිපත් කරන අතර ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට එහි කාර්යයන් සඳහා පහසුකම් සපයයි.

මෙම අංශයේ ප්‍රධානත්වය, අධ්‍යක්ෂ (පාලන) විසින් දරනු ලබයි.

<u>ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශය</u>

ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශය විසින් රාජ්‍ය ප්‍රසම්පාදන සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, ප්‍රමිතිකරණය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනු ලබයි. මෙම අංශය විසින් රාජ්‍ය ප්‍රසම්පාදනය හා සම්බන්ධ වූ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණ සහ නිර්දේශ සපයනු ලැබේ. එසේම, රාජ්‍ය ආයතනවල ධාරිතා වර්ධන වැඩසටහන්, පුහුණු කිරීම් සහ දැනුවත් කිරීම් ද මෙම අංශයට පැවරෙන අතර රාජ්‍ය ප්‍රසම්පාදනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් ජා.ප්‍ර.කො.ස. වෙත යොමු කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තා ඉදිරිපත් කරනු ලබයි.

මෙම අංශයේ ප්‍රධානත්වය, අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) විසින් දරනු ලබයි.

**<u>ප්‍රසම්පාදන අධීක්ෂණ අංශය</u>**

රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ, වැඩ, සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය, කලින් අනුමත කරන ලද ක්‍රියාකාරී සැලසුම්වලට අනුව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලසුම් මත සිදුකරනු ලබන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සහ අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීම මෙම අංශයේ වගකීම වේ.

තවද, ප්‍රසම්පාදන අස්තිත්වයන්, ප්‍රසම්පාදන පටිපාටිවලට කෙතරම් දුරට අනුගත වන්නේ ද යන්න මෙම අංශය විසින් අධීක්ෂණය කරනු ලබන අතර, රාජ්‍ය ප්‍රසම්පාදනයට අදාල කරුණු සම්බන්ධයෙන් ජා.ප්‍ර.කො.ස. වෙත යොමු කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තා ඉදිරිපත් කරනු ලබයි.

මෙම අංශයේ ප්‍රධානත්වය, අධ්‍යක්ෂ (අධීක්ෂණ) විසින් දරනු ලබයි.

**<u>ප්‍රසම්පාදන විමර්ශන අංශය</u>**

මෙම අංශය මගින්, නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ක්‍රියා පටිපාටිවලින් බැහැරව රාජ්‍ය ආයතන විසින් සිදු කරන ලද ප්‍රසම්පාදන පිළිබඳ පැමිණිලි/වාර්තා විමර්ශනය කිරීම සහ එම ප්‍රසම්පාදන සඳහා වගකිව යුතු නිලධාරීන් අවශ්‍ය කටයුතු සඳහා අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීම සහ ඉදිරි ප්‍රසම්පාදනවලදී එවැනි අඩුපාඩු නැවත සිදු නොවීම සඳහා උපදෙස් ලබා දෙනු ලබයි. එසේම, රාජ්‍ය ප්‍රසම්පාදනයට අදාල කරුණු සම්බන්ධයෙන් ජා.ප්‍ර.කො.ස. වෙත යොමු කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තා ඉදිරිපත් කරනු ලබයි.

මෙම අංශයේ ප්‍රධානත්වය, අධ්‍යක්ෂ (විමර්ශන) විසින් දරනු ලබයි.

# 2 වන පරිච්ඡේදය

## 2.1 පරිපාලන අංශය

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභා කාර්යාලයේ ආයතනික කටයුතු මෙන්ම ජා.ප්‍ර.කො.ස හි සේවා සම්පාදන ධාරිතාව ශක්තිමත් කිරීමේ මූලික වගකීම පරිපාලන අංශයට පැවරී ඇත. මෙම අංශයේ ප්‍රධානියා, අධ්‍යක්ෂ (පාලන) වේ.

## 2.2 පරිපාලන අංශයේ ප්‍රගතිය

### 2.2.1 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

**සේවක සංඛ්‍යාව**

කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී ඇති අනුමැතියට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සඳහා වන මුළු සේවක සංඛ්‍යාව 50 කි.

2024 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සිටින සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

වගුව: 1 - 2024/12/31 දිනට ජා.ප්‍ර.කො.ස. සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර

| අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 50 | 23 | 27 |

වගුව: 2 - ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව - 2024.12.31 දිනට කාර්ය මණ්ඩල වාර්තාව

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය | රා.ප.ච. 03/2016 අනුව වැටුප් සංකේතය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සේවයේ නිරතව සිටින | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | මහ ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | SL-3 | 1 | 1 | 0 |
| 2 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | SL-3 | 1 | 0 | 1 |
| 3 | ප්‍රසම්පාදන විශේෂඥ | කොන්ත්‍රාත් පදනම මත | | රු.88000+ 7800 | 3 | 0 | 3 |
| 4 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | 1 | SL-1 | 2 | 2 | 0 |
| 5 | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | III/II | SL-1 | 2 | 0 | 2 |
| 6 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ඉං.සේ. | 1 | SL-1 | 1 | 1 | 0 |
| 7 | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ඉ.සේ. | 111/11 | SL-1 | 1 | 0 | 1 |
| 8 | ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ. | 1 | SL-1 | 1 | 1 | 0 |
| 9 | ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ. | 111/11 | SL-1 | 2 | 1(වැ.බ.) | 2 |
| 10 | නීති නිලධාරි | දෙපාර්තමේන්තුගත | 111/11 | SL-1 | 1 | 0 | 1 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 11 | පරිපාලන නිලධාරි | කළමණාකරන සේවා නිලධාරි සේවය | අධි පන්තිය | MN-7 | 1 | 1 | 0 |
| 12 | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | 1 | MN-6 | 2 | 1 | 1 |
| 13 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 2 පන්තිය 11/1 | MN-6 | 1 | 0 | 1 |
| 14 | සභාපති ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | _ | රා.ප.ච.ලේ. 03/2016 අනුව | 1 | 1 | 0 |
| 15 | මහ ලේකම් ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | _ | රා.ප.ච.ලේ. 03/2016 අනුව | 1 | 1 | 0 |
| 16 | සංවර්ධන නිලධාරි | සංවර්ධන නිලධාරි සේවය | 111/11/1 | MN-4 | 10 | 6 | 4 |
| 17 | කළමණාකරන සේවා නිලධාරි | කළමණාකරන සේවා නිලධාරි සේවය | 111/11/1 | MN-2 | 8 | 02(සක්‍රිය) 01(කොන්ත්‍රාත්) | 5 |
| 18 | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 111/11/I විශේෂ | PL-3 | 6 | 02(සක්‍රිය) 01(කොන්ත්‍රාත්) | 3 |
| 19 | කාර්යාල කාර්ය සහායක | කාර්යාල සේවක සේවය | 111/11/I විශේෂ | PL-1 | 5 | 2 | 3 |
| | | | | | **50** | **23** | **27** |

### 2.2.2 කොමිෂන් සභාවට පත් කරන ලද / අනුයුක්ත කරන ලද නිලධාරීන් - 2024

වගුව: 3 - 2024 වර්ෂය තුළ කොමිෂන් සභාවට පත් කරන ලද / අනුයුක්ත කරන ලද නිලධාරීන් (ස්ථිර, තාවකාලික, කොන්ත්‍රාත්, වැඩ බලන)

| | නම | තනතුර | ක්‍රියාත්මක දිනය |
|---|---|---|---|
| 01 | එල්.එච්.ඒ. ධර්මසේන මයා | කළ.සේ.නි. (කොන්ත්‍රාත්) | 2024.03.01 |
| 02 | බී.එන්.පී.සී. පෙරේරා මෙනවිය | පරිපාලන නිලධාරී | 2024.03.06 |
| 03 | බී.ඒ.ඩී. ප්‍රමෝදිකා මෙය | ගණකාධිකාරී (වැ.බ.) | 2024.03.13 සිට වසරක් සඳහා |
| 04 | ඒ.එම්.වී. මීපේගම මිය | කළ.සේ.නි. 1 | 2024.04.16 |
| 05 | ජේ.වී. සුමිත් තිලක්ලාල් මයා | රියදුරු (කොන්ත්‍රාත්) | 2024.07.01 |
| 06 | ඒ.ආර්. මානෙල් මිය | සං.නි. 1 | 2024.07.22 |
| 07 | වයි.එච්. ගුණවර්ධන මිය | මහලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් (තාවකාලික) | 2024.10.01 |
| 08 | එම්.ඒ. ගාමිණී මයා | භාෂා පරිවර්තක | 2024.10.21 |
| 09 | ඒ.පී.එස්.පී. වාස් ගුණවර්ධන මයා | රියදුරු (කොන්ත්‍රාත් ) | 2024.11.01 |

### 2.2.3 මානව සම්පත් සංවර්ධනය

වගුව: 4 - 2024 වර්ෂය තුළ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩමුළු/ පුහුණු වැඩසටහන් - දේශීය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුරු නාමය | පුහුණු වැඩසටහන | පුහුණු කාලය | පුහුණු කාලය (පැය) | පුහුණු ආයතනය |
|---|---|---|---|---|---|---|
| 01 | ජී.එන්.කේ. විජේතුංග මිය | අධ්‍යක්ෂ (පාලන) | Speechcraft Training Programme | 2024.10.23 සිට ප.ව.4.30 - ප.ව. 5.15 (පැය 2 බැගින්) අඟහරුවාදා දින 10 ක් | පැය 20 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | | | Capacity Building Programme – ADB | 2024.06.03-2024.06.05 | දින 03 | ආසියානු සංවර්ධන බැංකුව |
| | | | Capacity Building Programme – on tax Crimes Investigation | 2024.12.02-2024.12.05 | දින 04 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| 02. | ඒ.පී.ඩී.අයි. ප්‍රසන්න මයා | අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) | තිරසාර ප්‍රසම්පාදනය | 2024.06.26 - 2024.06.27 | දින 02 | පරිසර අමාත්‍යාංශය |
| 03. | එස්. මහීන්තන් මයා | අධ්‍යක්ෂ (විමර්ශන) | Capacity Building Programme – on tax Crimes Investigation | 2024.12.02-2024.12.05 | දින 04 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| 04. | පී.ඒ.ඩී.එම්.ඩී පොන්වීර | අධ්‍යක්ෂ (අධීක්ෂණ) | තිරසාර ප්‍රසම්පාදනය | 2024.06.26 - 2024.06.27 | දින 02 | පරිසර අමාත්‍යාංශය |
| 05. | බී.එන්.පී.සී. පෙරේරා මෙය | පරිපාලන නිලධාරි | ITMIS | 2024.04.22 - 2024.04.26 | දින 04 | මුදල් අමාත්‍යාංශය |
| | | | Capacity Building Programme – ADB | 2024.06.03-2024.06.05 | දින 04 | ආසියානු සංවර්ධන බැංකුව |
| 06. | යශිකා ශ්‍රීමාලි මිය | සංවර්ධන නිලධාරි | Training Program on The World Bank Procurement Framework | 2024.03.19 - 2024.03.22 | දින 04 | ලෝක බැංකුව |
| | | | Diploma in Procurement & Contract Administration -2025 | 2024.12.19 සිට | වසරක කාලයක් | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| | | | Asia, the Next Five Project Exit Strategy Workshop | 2024.11.07 - 2024.11.08 | දින 02 | පරිසර අමාත්‍යාංශය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 07. | ඩී.එස්.සී. එදිරිසූරිය මයා | සංවර්ධන නිලධාරි | Capacity Building Programme – ADB | 2024.06.03-2024.06.05 | දින 04 | ආසියානු සංවර්ධන බැංකුව |
| | | | ITMIS | 2024.04.22 - 2024.04.26 | දින 04 | මුදල් අමාත්‍යාංශය |
| | | | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 2024 .09.27 සිට<br>සිකුරාදා දින 10 ක් | පැය 70 | නිපුණතා සංවර්ධන අරමුදල |
| 08. | එන්.ජී. අබේසූරිය මිය | සංවර්ධන නිලධාරි | ITMIS | 2024.04.22 - 2024.04.26 | දින 04 | මුදල් අමාත්‍යාංශය |
| | | | Diploma in Procurement & Contract Administration -2025 | 2024.12.19 සිට | වසරක කාලයක් | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| 09. | පී.යූ. වෙදගේ මිය | සංවර්ධන නිලධාරි | Diploma in Procurement & Contract Administration -2025 | 2024.12.19 සිට | වසරක කාලයක් | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| | | | Capacity Building Programme – ADB | 2024.06.03-2024.06.05 | දින 04 | ආසියානු සංවර්ධන බැංකුව |
| 10. | ඕෂධී අබේරත්න මිය | සංවර්ධන නිලධාරි | Training Program on The World Bank Procurement Framework | 2024.03.19 - 2024.03.22 | දින 04 | ලෝක බැංකුව |
| | | | Diploma in Procurement & Contract Administration -2025 | 2024.12.19 සිට | වසරක කාලයක් | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| 11. | අරුණි මීපේගම මිය | කළ.සේ.නි. | ITMIS | 2024.04.22 - 2024.04.26 | දින 04 | මුදල් අමාත්‍යාංශය |
| | | | Capacity Building Programme – ADB | 2024.06.03-2024.06.05 | දින 04 | ආසියානු සංවර්ධන බැංකුව |
| | | | Asia, the Next Five Project Exit Strategy Workshop | 2024.11.07 - 2024.11.08 | දින 02 | පරිසර අමාත්‍යාංශය |

### 2.2.4 කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩමුළු සහ පුහුණු වැඩසටහන් - 2024

වගුව: 5 - 2024 වර්ෂය තුළ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩමුළු/ පුහුණු වැඩසටහන් - විදේශීය

| අනු අංකය | නම | තනතුරු නාමය | පුහුණු වැඩසටහන | එය පවත්වන ලද රට | පුහුණු කාලය |
|---|---|---|---|---|---|
| 01 | සුධර්මා කරුණාරත්න මිය | සභාපතිනිය | Global Procurement Summit – 2024 | ඉන්දියාව | 2024.02.08 – 2024.02.09 |
| | | | International Procurement Workshop | දකුණු කොරියාව | 2024.09.25 – 2024.09.27 |
| 02 | අයිවන් තිසේරා මයා | සාමාජික | Green Public Procurement and Ecolabelling study visit | ජර්මනිය | 2024.12.15 – 2024.12.21 |
| 03 | ඩී.සී. සිරිබද්දන මයා | මහලේකම් | International Public Procurement Workshop | දකුණු කොරියාව | 2024.04.17– 2024.04.19 |
| | | | e- GP System Development Implementation and Rollout in Sri Lanka – Exposure Visit | බංග්ලාදේශය | 2024.06.01– 2024.06.05 |
| | | | e- GP System Development Implementation and Rollout in Sri Lanka – Exposure Visit | ඉන්දියාව | 2024.09.02 – 2024.09.03 |
| | | | 10th conference of the Asia Pacific Public Electronic Procurement Network | පිලිපීනය | 2024.12.11– 2024.12.13 |
| 04 | ඒ.පී.ඩී.අයි. ප්‍රසන්න මයා | අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) | Sustainable / Green Public Procurement Expert Meeting | තායිලන්තය | 2024.03.27 – 2024.03.30 |
| | | | Training On Life Cycle costing within Sustainable Public Procurement | තායිලන්තය | 2024.09.24 – 2024.09.26 |
| | | | Green Public Procurement and Ecolabelling study visit | ජර්මනිය | 2024.12.15 – 2024.12.21 |
| 05 | පී.ඒ.ඩී.එම්. පොන්වීර මයා | අධ්‍යක්ෂ (අධීක්ෂණ) | International Public Procurement Workshop | දකුනු කොරියාව | 2024.04.17 – 2024.04.19 |
| | | | ADB South Asia Portfolio Forum – 2024 | ඉන්දුනීසියාව | 2024.11.11 – 2024.11.13 |
| 06 | ජී.එන්.කේ. විජේතුංග මිය | අධ්‍යක්ෂ (පාලන ) | Seminar on Application and management of PPT mode of Sri Lanka | චීනය | 2024.10.11 – 2024.10.24 |

## 2.3 මූල්‍ය අංශය

මූල්‍ය අංශය විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මූල්‍ය කටයුතු මෙහෙයවනු ලබන අතර විධිමත් තොරතුරු සහ කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යාම සිදුකරනු ලබයි. 2024 වර්ෂය සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට අයවැය ප්‍රතිපාදන වශයෙන් රුපියල් මිලියන 129 ක් වෙන් කර තිබුණි. එම ප්‍රතිපාදනයෙන් 69.8% (රුපියල් මිලියන 90.04)ක් වැය කරන ලද අතර ඒ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

## වගුව: 6 - මූල්‍ය ප්‍රගතිය

| ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | | | | | | |
|---|---|---|---|---|---|---|
| වැය විෂය අංකය | විස්තරය | ප්‍රතිපාදන | ප්‍රතිපාදන භාවිත කළ ප්‍රමාණය | ප්‍රතිපාදන භාවිත කළ ප්‍රමාණයේ | ප්‍රතිපාදන ප්‍රමාණය | ඉතිරිවීම් ප්‍රතිශතය |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| 1001 | වැටුප් හා වේතන | 14,150,000.00 | 12,442,488.53 | 87.93% | 1,707,511.47 | 12.07% |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,600,000.00 | 303,304.62 | 18.96% | 1,296,695.38 | 81.04% |
| 1003 | වෙනත් දීමනා | 15,650,000.00 | 15,609,106.88 | 99.74% | 40,893.12 | 0.26% |
| 1101 | දේශීය | 37,500.00 | 3,150.00 | 8.40% | 34,350.00 | 91.60% |
| 1102 | විදේශීය | 1,207,500.00 | 1,207,331.50 | 99.99% | 168.50 | 0.01% |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,500,000.00 | 923,329.29 | 61.56% | 576,670.71 | 38.44% |
| 1202 | ඉන්ධන | | | | | |
| 2 | ඉන්ධන දීමනාව | 5,600,000.00 | 5,540,605.00 | 98.94% | 59,395.00 | 1.06% |
| 9 | සංචිත වාහන සඳහා ඉන්ධන | 2,100,000.00 | 173,290.56 | 8.25% | 1,926,709.44 | 91.75% |
| 10 | ඉන්ධන - වෙනත් | 1,200,000.00 | 42,740.76 | 3.56% | 1,157,259.24 | 96.44% |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | | | | | |
| 2 | නිල ඇඳුම් | 100,000.00 | 4,000.00 | 4.00% | 96,000.00 | 96.00% |
| 1205 | සැපයීම් - වෙනත් | 2,000,000.00 | 815,469.24 | 40.77% | 1,184,530.76 | 59.23% |
| 1301 | වාහන නඩත්තු වියදම් | 1,600,000.00 | 1,574,527.17 | 98.41% | 25,472.83 | 1.59% |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000.00 | 70,320.00 | 23.44% | 229,680.00 | 76.56% |
| 1401 | ප්‍රවාහන | 2,500,000.00 | 2,442,235.78 | 97.69% | 57,764.22 | 2.31% |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 1,175,000.00 | 1,162,949.31 | 98.97% | 12,050.69 | 1.03% |
| 1403 | විදුලිය සහ ජලය | 1,650,000.00 | 1,649,499.43 | 99.97% | 500.57 | 0.03% |
| 1404 | බදු කුළී සහ පළාත් පාලන ආයතන බදු | 150,000.00 | 40,000.00 | 26.67% | 110,000.00 | 73.33% |
| 1405 | පිරිසිදු කිරීමේ සේවා | 1,000,000.00 | 896,316.00 | 89.63% | 103,684.00 | 10.37% |
| 1407 | ආරක්ෂක සේවා | 1,500,000.00 | 1,392,202.51 | 92.81% | 107,797.49 | 7.19% |
| 1408 | මෙහෙයුම් කල්බදු යටතේ මිලදී ගත් වාහන සඳහා කල්බදු කුළිය | 3,000,000.00 | - | 0.00% | 3,000,000.00 | 100.00% |
| 1409 | වෙනත් | | - | | | |
| 138 | යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ සේවා ගිවිසුම් | 200,000.00 | - | 0.00% | 200,000.00 | 100.00% |
| 139 | වාහන රක්ෂණය | 500,000.00 | 226,641.42 | 45.33% | 273,358.58 | 54.67% |
| 140 | විවිධ සේවා වියදම් | 2,000,000.00 | 1,903,135.40 | 95.16% | 96,864.60 | 4.84% |
| 1506 | රජයේ නිලධාරීන්ගේ දේපල ණය පොළිය | 100,000.00 | 80,371.39 | 80.37% | 19,628.61 | 19.63% |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 180,000.00 | 176,224.16 | 97.90% | 3,775.84 | 2.10% |
| මූලධන වියදම් | | | | | | |
| 2001 | වත්කම් ප්‍රනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම - ගොඩනැගිලි හා ඉදිකිරීම් | 50,000,000.00 | 38,783,451.92 | 77.57% | 11,216,548.08 | 22.43% |
| 2002 | වත්කම් ප්‍රනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000.00 | - | 0.00% | 100,000.00 | 100.00% |
| 2003 | වත්කම් ප්‍රනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම - වාහන | 1,000,000.00 | 553,250.00 | 55.33% | 446,750.00 | 44.68% |
| 2102 | වත්කම් අත්පත් කර ගැනීම - ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,000,000.00 | - | 0.00% | 1,000,000.00 | 100.00% |
| 2103 | වත්කම් අත්පත් කර ගැනීම - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,900,000.00 | 358,211.20 | 12.35% | 2,541,788.80 | 87.65% |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 1,000,000.00 | 375,000.00 | 37.50% | 625,000.00 | 62.50% |
| | ප්‍රසම්පාදන වාර්තා හා අනුවර්තනය | | - | | - | |
| 2509 | වෙනත් | 12,000,000.00 | 1,286,896.37 | 10.72% | 10,713,103.63 | 89.28% |
| | | 129,000,000.00 | 90,036,048.44 | 69.80% | 38,963,951.56 | 30.20% |

# 3 වන පරිච්ඡේදය

## 3.1 ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශය

රාජ්‍ය ප්‍රසම්පාදනයට අදාළව මාර්ගොපදේශ, පටිපාටි හා උපමාන ඇතුළත් ප්‍රතිපත්ති සකස් කිරීම මෙම අංශයේ ප්‍රමුඛතම කාර්ය භාරය වේ. එසේම, රාජ්‍ය ආයතන විසින්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ ගැටලු, විමසීම්, පැහැදිලි කිරීම් හා උපදෙස් සඳහා වන ඉල්ලීම් අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම. රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතුවල යෙදී සිටින නිලධාරීන්ගේ ධාරිතා වර්ධනයට අදාළ වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙම අංශය මගින් සිදුකරනු ලබයි.

## 3.2 ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශයේ ප්‍රගතිය

2024 වර්ෂය තුළ දී පහත සඳහන් ආයතන/පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද, ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ ගැටලු, විමසීම්, පැහැදිලි කිරීම් හා උපදෙස් සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.

01. ලංකා බැංකුව
02. ලංකා විදුලිබල මණ්ඩලය
03. ලංකා ඛනිජ තෙල් සංස්ථාව
04. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
05. රාජ්‍ය ගිණුම් කාරක සභාව
06. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
07. සීමාසහිත ක්‍රියේටිව් ටෙක්ස්ටයිල්ස් මිල්ස් (පෞද්ගලික) සමාගම
08. ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශය
09. ජන සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
10. අධ්‍යාපන දෙපාර්තමේන්තුව (වයඹ)
11. විභාග දෙපාර්තමේන්තුව
12. රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
13. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
14. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
15. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
16. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
17. සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
18. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
19. DIMO පුද්ගලික සමාගම.
20. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල
21. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර
22. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චි
23. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
24. මැතිවරණ කොමිෂන් සභාව
25. අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ අංශය. ප්‍රධාන කාර්යාලය - බණ්ඩාරගම
26. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
27. කුඹලාතර කන්ස්ට්‍රක්ෂන්ස් සමාගම
28. ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
29. ලංකා ගල් අඟුරු සමාගම (පුද්ගලික) සමාගම
30. මාල්බෝ වෙළඳ සමාගම
31. මෙට්‍රොපොලිටන් ආයතනය

32. කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
33. බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
34. ආරක්ෂක අමාත්‍යාංශය
35. අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
36. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
37. අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
38. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
39. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
40. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
41. මහජන ආරක්ෂක අමාත්‍යාංශය
42. ග්‍රාමීය හා නාගරික සංවර්ධන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
43. ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය
44. තාක්ෂණ අමාත්‍යාංශය
45. සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය
46. වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
47. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
48. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
49. කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
50. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
51. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වූ ජාතික ආයතනය
52. ශ්‍රී ලංකාවේ ජාතික ඉදිකිරීම් සංගමය
53. ජාතික රක්ෂණ භාර අරමුදල
54. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය
55. වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව
56. අමාත්‍ය මණ්ඩල කාර්යාලය
57. සබරගමුව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය
58. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - බස්නාහිර පළාත
59. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
60. ජනාධිපති ලේකම් කාර්යාලය
61. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
62. රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව
63. සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය
64. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සහ පශ්චාත් උපාධි වෛද්‍ය පුහුණු මධ්‍යස්ථානය
65. ශ්‍රී ලංකා හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.
66. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
67. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව
68. ශ්‍රී ලංකා රාජ්‍ය වෙළඳ නීතිගත සංස්ථාව
69. ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
70. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය
71. ශ්‍රී ලංකා රාජ්‍ය ඔෟෂධ නිෂ්පාදන සංස්ථාව
72. රාජ්‍ය දැව සංස්ථාව
73. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
74. බදුල්ල ශික්ෂණ රෝහල
75. කොළඹ විශ්වවිද්‍යාලය, සහ
76. විවිධ පාර්ශ්වයන්.

**රාජ්‍ය ප්‍රසම්පාදනයට අදාළව මාර්ගොපදේශ, පටිපාටි හා උපමාන ඇතුළත් ප්‍රතිපත්ති සකස් කිරීම යටතේ ප්‍රතිපත්ති අංශය මගින් පහත දැක්වෙන මාර්ගොපදේශයන් සහ පටිපාටි සැකසීම සම්බන්ධ කාර්යයන් සිදු කරන ලදී.**

**i. භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා සඳහාවන ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහය 2024**

ඉහත මාර්ගෝපදේශ සංග්‍රහය 2024.11.25 දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අතර 2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාල චක්‍රලේඛය නිකුත් කරන ලදී. එසේම, ඒ සඳහා වන අත්පොත ද ඒ සමඟම ප්‍රකාශයට පත් කරන ලදී.

**ii. උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහාවන මාර්ගෝපදේශ සංග්‍රහය**

උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහාවන මාර්ගෝපදේශ සංග්‍රහය කෙටුම්පත් කර ඇති අතර, ඊට අදාළ අත්පොත ද සමග 2025 වර්ෂය තුළ දී නිකුත් කිරීමට නියමිත ය.

**iii. කොන්ත්‍රාත් කළමනාකරණය සඳහාවන මාර්ගෝපදේශ සංග්‍රහය**

මූලික කෙටුම්පත සම්පූර්ණ කර ඇති අතර සමාලෝචන අවස්ථාවේ පවතී.

**iv. ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහාවන මාර්ගෝපදේශ සංග්‍රහය**

ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහය යටතේ මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ පළමු කෙටුම්පත සකස් කර මේ වන විට සමාලෝචන අදියරෙහි පවතී.

**v. රාජ්‍ය ප්‍රසම්පාදනය සඳහාවන පනත**

ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහය යටතේ මෙම පනතෙහි පළමු කෙටුම්පත සකස් කර මේ වන විට සමාලෝචන අදියරෙහි පවතී.

**vi. විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදනය (e-GP)**

විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදනය (e-GP) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම් පරිදි අවශ්‍ය මාර්ගෝපදේශ, උපදෙස්, නිරීක්ෂණ හා යෝජනා ලබා දෙන ලදී.

**vii. තිරසර/හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය**

තිරසර/ හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය හඳුන්වා දීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ, නිරීක්ෂණ හා යෝජනා ඉදිරිපත් කරන ලදී.

## 3.3 ධාරිතා වර්ධනය

**i. පුහුණු වැඩසටහන්**
රාජ්‍ය අංශය ඉලක්ක කර ගනිමින් 2025 වර්ෂය සඳහාවන පුහුණු සැලැස්ම සකස් කරන ලදී.

**ii. දැනුවත් කිරීමේ වැඩසටහන්**
භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා සඳහාවන ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහය 2024 සඳහාවන දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සැලසුම් කරන ලද අතර පහත වැඩ සටහන් 2024 වසරේ දී පවත්වන ලදී.

අ) අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ විශේෂ වියදම් ඒකක ප්‍රධානීන් සඳහා - 2024 දෙසැම්බර් 6 වන දින, සහ

ආ) දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් සඳහා - 2024 දෙසැම්බර් 13 වන දින.

වගුව: 7 - ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ ගැටලු, විමසීම් පැහැදිලි කිරීම් හා උපදෙස් සඳහා ,ඉදිරිපත් වූ හා ක්‍රියාකරන ලද ඉල්ලීම් - 2024

| අනු අංකය | ගොනු අංකය | ගොනු ශීර්ෂය | අදාළ ආයතනය |
|---|---|---|---|
| 1 | NPC/PP/01/CL-01/2024 | අයවැය යෝජනා ක්‍රියාතමක කිරීම හා 2024 ප්‍රගතිය වාර්තා කිරීම | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 2 | NPC/PP/01/CL-02/2024 | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය හරහා පළාත් සහා මට්ටමින් ක්‍රියාත්මක යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ පැහැදිලි කිරීම . | දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාමීය සංවර්ධන, සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ ගෘහ ආර්ථික අභිවෘර්ධි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, ගාල්ල |
| 3 | NPC/PP/01/CL-03/2024 | ප්‍රසම්පාදනය කෙරෙහි වැට් බද්දේ බලපෑම - ශ්‍රී ලංකා වෛද්‍ය සභාව | ශ්‍රී ලංකා වෛද්‍ය සභාව |
| 4 | NPC/PP/01/CL-04/2024 | පැහැදිලිකර ගැනීමක් සඳහා ඉල්ලීම - රාජ්‍ය දැව සංස්ථාව | රාජ්‍ය දැව සංස්ථාව |
| 5 | NPC/PP/01/CL-05/2024 | රුසියාවේ මොස්කව් සහ පීටර්ස්බර්ග් නගරවල සුපිරි වෙළඳසැල්වල ශ්‍රී ලංකා තේ ස්න්නාමය ප්‍රචලිත කිරීමේ වැඩසටහන | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| 6 | NPC/PP/01/CL-06/2024 | ශ්‍රී ලංකාවේ ඌව සහ මධ්‍යම පළාත්වල කොවිඩ් - 19 වසංගතයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම . | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 7 | NPC/PP/01/CL-07/2024 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා ජංගම රාක්ක පද්ධතියක් ස්ථාපිත කිරීම | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| 8 | NPC/PP/01/CL-08/2024 | CIDA/SBD/02 සහ CIDA/SBD/04 පිළිබඳ සංශෝධනයන් | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය |
| 9 | NPC/PP/01/CL-09/2024 | ද්‍රව්‍ය සැපයුම්කරුවන් සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය |
| 10 | NPC/PP/01/CL-10/2024 | SBD/01(වැඩ ප්‍රසම්පාදන) හා SBD/03 සුළු කොන්ත්‍රාත් සඳහා සංස්කාරක කමිටුවට නාමයෝජනා කරන ලෙස ඉල්ලීම | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය |
| 11 | NPC/PP/01/CL-11/2024 | දේශීය නියෝජිතයන් විසින් ඉටුකරනු ලබන අලුත්වැඩියා කටයුතු | විභාග දෙපාර්තමේන්තුව |
| 12 | NPC/PP/01/CL-12/2024 | ප්‍රසම්පාදන කමිටුවල දැනට බල පැවැත්වෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 යටතේ වූ අධිකාරී සීමාවන් සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා පොලීසිය විසින් කර ඇති යෝජනාව. | මහජන ආරක්ෂක දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| 13 | NPC/PP/01/CL-13/2024 | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාව සඳහා වන විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහනේ කොටසක් ලෙස, 2023 සැප්තැම්බර් මාසයේදී සිදුකළ ශ්‍රී ලංකාවේ පාලන ක්‍රමවේද පිළිබඳ තක්සේරුව )GDA). | ජනාධිපති කාර්යාලය |
| 14 | NPC/PP/01/CL-14/2024 | සියලුම පළාත් පාලන ආයතන වලට අදාළව සකස් කරන ලද ප්‍රසම්පාදන මාර්ගපදේශය සහ අත්පොත | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය |
| 15 | NPC/PP/01/CL-15/2024 | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද SBD යටතේ පිහිටුවන ලද කොන්ත්‍රාත්තු වල ගෙවීම් සහතික සකස් කිරීමේදී 2006 ප්‍රසම්පාදන අත්පොතෙහි 5.4.6 වගන්තිය අදාළකර ගැනීම පිළිබඳ පැහැදිලි කිරීමක් ලබා ගැනීම . | වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව |
| 16 | NPC/PP/01/CL-16/2024 | UV Visible Spectrophotometer මිලදී ගැනීම, ඇණවුම අංක 008292 | කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| 17 | NPC/PP/01/CL-17/2024 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ගේ පූර්ව සුදුසුකම් සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් සංවිධානය කරන ලෙස ඉල්ලීම . | ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව |
| 18 | NPC/PP/01/CL-18/2024 | විද්‍යුත් රජ්‍ය ප්‍රසම්පාදන )e-GP) පද්ධතියේ 2.1 අනුවාදය වෙනුවෙන් වූ සම්මත ලංසු ලේඛනය සඳහා අනුමැතිය ඉල්ලා සිටීම. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව |
| 19 | NPC/PP/01/CL-19/2024 | අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීමේදී බැංකු ඇපකරය වෙනුවට කාර්යසාධන සුරක්ෂාව ලෙස ණයවර ලිපියෙන් / ගෙවීම් ලේඛනයෙන් %10ක් රඳවා ගැනීම පිළිබඳව විරෝධතාවක් නොමැති බව දැක්වෙන ලිපියක් සඳහා වන ඉල්ලීම. | ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව |
| 20 | NPC/PP/01/CL-20/2024 | ලෝක බැංකු අරමුදල් සැපයෙන ICDP ව්‍යාපෘතිය | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය |
| 21 | NPC/PP/01/CL-21/2024 | වර්ෂය සඳහා බන්ධනාගාර 2025/2024 දෙපාර්තමේන්තුවට ආහාර ද්‍රව්‍ය සැපයීමේ විධිවිධාන | අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය |
| 22 | NPC/PP/01/CL-22/2024 | රාජ්‍ය දැව සංස්ථාවේ )2023/2024) වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ප්‍රසම්පාදන අංක) STC/PSM/2022.05/LP/27( | රාජ්‍ය දැව සංස්ථාව |
| 23 | NPC/PP/01/CL-23/2024 | 2023 අංක දරන දූෂණ විරෝධී පනත 09 යටතේ සිදුකෙරෙන විමර්ශනය | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | |
|---|---|---|---|
| 24 | NPC/PP/01/CL-24/2024 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද, රුපියල් මිලියන 10 නොඉක්මවන කුඩා වටිනාකමකින් යුත් වැඩ ප්‍රසම්පාදන 2006 ප්‍රසම්පාදන සඳහා 5.4.9 සහ 5.4.8 මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්ති යටතේ කාර්යසාධන සුරක්ෂාව .අත්හැරීම | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 25 | NPC/PP/01/CL-25/2024 | සුදුසුකම්ලත් පුද්ගලයන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීම | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය |
| 26 | NPC/PP/01/CL-26/2024 | ප්‍රසම්පාදනයට අනුකූලව ඉදිකිරීම් කොන්ත්‍රාත් කාල සීමාවන් සංශෝධනය කිරීම සඳහා ඉල්ලීම | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය |
| 27 | NPC/PP/01/CL-27/2024 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ යෝජනා පිළිබඳව විමසීම | තාක්ෂණ අමාත්‍යාංශය |
| 28 | NPC/PP/01/CL-28/2024 | පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය වේගවත් කිරීම | විදුලියබල හා බලශක්ති අමාත්‍යාංශය |
| 29 | NPC/PP/01/CL-29/2024 | වර්ෂය වෙනුවෙන් පාසල් පෙළපොත් 2023 ප්‍රකාශනය උදෙසා භාවිත කළ යුතු ලංසු .ලේඛන සඳහා අනුමැතිය ලබා ගැනීම | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| 30 | NPC/PP/01/CL-30/2024 | ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රසම්පාදනන ක්‍රියාවලිය තුළ පැණනගින ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳව සාකච්ඡා කිරීම | ආරක්ෂක අමාත්‍යාංශය |
| 31 | NPC/PP/01/CL-31/2024 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සඳහා අධිකාරිය පැවරීම | විදුලියබල හා බලශක්ති අමාත්‍යාංශය |
| 32 | NPC/PP/01/CL-32/2024 | ගැටඹේ, සමෘද්ධි සමුපකාර බැංකුවේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම පළමු අදියර - සම්බන්ධයෙන් ලංසු කැඳවීමට එකඟතාව .ඉල්ලා සිටීම | දිස්ත්‍රික් ලේකම්කාර්යාලය, මහනුවර |
| 33 | NPC/PP/01/CL-33/2024 | තේ පර්යේෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා කාර්යාල සඳහා ආරක්ෂක සේවා පත් කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම. | ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය |
| 34 | NPC/PP/01/CL-34/2024 | සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අධීක්ෂණ කාර්ය මණ්ඩලය පත් කිරීමේ හදිසි අවශ්‍යතාව | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 35 | NPC/PP/01/CL-35/2024 | ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් සහ ප්‍රසම්පාදනයේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය. | කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 36 | NPC/PP/01/CL-36/2024 | සබරගමුව පළාතේ මූලික රෝහල් වලට ඖෂධ දවටන සැපයීම සඳහා දේශීය සැපයුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම. | සබරගමුව පළාත් ප්‍රධානන ලේකම් කාර්යාලය |
| 37 | NPC/PP/01/CL-37/2024 | කෙටුම්පත් චක්‍රලේඛය තාක්ෂණික ඇගයීම් - කමිටුවේ සංයුතිය පිළිබඳ පැහැදිලි කිරීම | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 38 | NPC/PP/01/CL-38/2024 | ප්‍රසම්පාදන කමිටුවේ ලේකම්වරයාට ගෙවීම් කිරීම | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව |
| 39 | NPC/PP/01/CL-39/2024 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කල්ලිකට්ටු කුලම පුනරුත්ථාපනය කිරීම | නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 40 | NPC/PP/01/CL-40/2024 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංශෝධනය කිරීම | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 41 | NPC/PP/01/CL-41/2024 | වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයීමේදී සැපයුම්කරුවන් විසින් මුහුණ දුන් අභියෝග | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 42 | NPC/PP/01/CL-42/2024 | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අමු වියළි/ ආහාර සැපයීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පූර්ව ලංසු රැස්වීමේදී අනාවරනය වූ පරිදි මණ්ඩල දෙකක් මගින් ලංසු විවෘත කිරීමට විරෝධතාව පළ කිරීම හා කරුණු සම්බන්ධ ලිඛිත පැමිණිල්ල | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 43 | NPC/PP/01/CL-43/2024 | ලංසුකරුවන් කිහිපදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලංසු අගයන් සමාන වූ විට කටයුතු කළ යුතු ආකාරය පිලිබඳ උපදෙස් පැතීම. | සබරගමුව පළාත් ප්‍රධානන ලේකම් කාර්යාලය |
| 44 | NPC/PP/01/CL-44/2024 | 2024 වර්ෂය සඳහා සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමයක් තෝරාගැනීම | රාජ්‍ය දැව සංස්ථාව |
| 45 | NPC/PP/01/CL-45/2024 | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ | රාජ්‍ය ගිණුම් කාරක සභාව |
| 46 | NPC/PP/01/CL-46/2024 | තොරතුරු දැනගැනීමේ පනත යටතේ ටෙන්ඩර් විවෘත කිරීම්වලදී සවිස්තරාත්මක තොරතුරු ලබාදීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම. | මාල්බෝ ට්‍රේඩිං සමාගම |
| 47 | NPC/PP/01/CL-47/2024 | DPC අධිකාරී සීමාව යටතේ DPC ටෙන්ඩර් ඇගයීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 48 | NPC/PP/01/CL-48/2024 | අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය පිළිබඳ ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ලද ලිපිය. | ජාතික රක්ෂණ භාර අරමුදල |

| | | | |
|---|---|---|---|
| 49 | NPC/PP/01/CL-49/2024 | භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2024 - බලාත්මක කිරීම. | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 50 | NPC/PP/01/CL-50/2024 | දැනට වැඩිදියුණුකර ඇති ප්‍රසම්පාදනය ක්‍රමවේදය අනුගමනය කිරීම සඳහා අනුමැතිය ඉල්ලා සිටීම | ලංකා විදුලි බල මණ්ඩලය |
| 51 | NPC/PP/01/CL-51/2024 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් ප්‍රසම්පාදනය ඩිජිටල්කරණය කිරීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමේ වේදිකාව ක්‍රියාත්මක කිරීම | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| 52 | NPC/PP/01/CL-52/2024 | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය තුළින් ක්‍රියාත්මක පළාත් සභාවේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 53 | NPC/PP/01/CL-53/2024 | බන්ධනාගාරවල නව අපජල පිරිපහදු යන්ත්‍ර ඉදිකිරීම %11 සෘජු ඉදිකිරීම් පිරිවැයෙන් - ක උපදේශන ගාස්තුවක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම සාධාරණීකරණය කිරීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 54 | NPC/PP/01/CL-54/2024 | බැංකු ඇපකර පිළිබඳ පැහැදිලි කිරීම් | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව |
| 55 | NPC/PP/01/CL-55/2024 | ජාතික ප්‍රසම්පාදන සහ රාජ්‍ය පෞද්ගලික - හවුල්කාරිත්ව පිළිබඳ නීති | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 56 | NPC/PP/01/CL-56/2024 | තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා ප්‍රසම්පාදන දීමනා ගෙවීමේ වැඩපිළිවෙල පිළිබඳව දැනුම් දීම | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය |
| 57 | NPC/PP/01/CL-57/2024 | පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන 2024 - .ක්‍රිකට් කට්ටල මිලදී ගැනීම - | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය |
| 58 | NPC/PP/01/CL-58/2024 | ග්‍රාම සංවර්ධන සමිතිවලට සෘජු කොන්ත්‍රාත් පිරිනැමීම සම්බන්ධව | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 59 | NPC/PP/01/CL-59/2024 | 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කොන්ක්‍රීට් කුට්ටිගල් ඇතිරීමේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා අනුමත කරන ලද ඒකක මිල යොදා නොගැනීම සම්බන්ධ මූලික විමර්ෂනය | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය |
| 60 | NPC/PP/01/CL-60/2024 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා නැවුම් කිරි ලීටර් ටෙට්‍රා 1 පැකට් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව |
| 61 | NPC/PP/01/CL-61/2024 | ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ පැහැදිලි කිරීම, ලංසු විවෘත කිරීම ලංසු අනුපිටපත - | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 62 | NPC/PP/01/CL-62/2024 | ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අත්තිකාරම් ගෙවීම් කිරීම. | අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය |
| 63 | NPC/PP/01/CL-63/2024 | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ශ්‍රේණිගත කිරීම් සීමා සංශෝධනය කිරීම | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය |

| | | | |
|---|---|---|---|
| 64 | NPC/PP/01/CL-64/2024 | සාකච්ඡාවක් සඳහා ඉල්ලීම ජාතික - ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සඳහා විශේෂිත | සීස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව/ |
| 65 | NPC/PP/01/CL-65/2024 | ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා වන මාර්ගෝපදේශවල 3.3 2022 -සහ වගන්ති සංශෝධනය කරන ලෙස 3.4 ඉල්ලා සිටීම | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 66 | NPC/PP/01/CL-66/2024 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සඳහා ඇඳ සෝපාන 05ක් සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා වන ටෙන්ඩරය | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 67 | NPC/PP/01/CL-67/2024 | එක් මිල ගණන් කැඳවීමක් මඟින් රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවෙන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට රාජ්‍ය ආයතනවලට අවස්ථාව ලබා දීම. | මුදල් අමාත්‍යාංශය |
| 68 | NPC/PP/01/CL-68/2024 | වායු සමීකරණ යන්ත්‍ර සවිකිරීම හා අළුත්වැඩියාව කුමන ආකාරයෙන් අර්ථ දක්වන්නේද (වැඩ හෝ සේවා) පිළිබඳව උපදෙස් ලබා ගැනීම. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 69 | NPC/PP/01/CL-69/2024 | මහපොළ මාර්ගගත ලොතරැයිය නැවත ක්‍රියාත්මක කිරීමට අදාලව පත් කරන ලද අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව පැමිණිල්ල. | වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය |
| 70 | NPC/PP/01/CL-70/2024 | ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් වෙත රඳවා ගත් මුදල් සහ බැඳුම්කර සහ ඇපකර නිදහස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මැදිහත්වීමක හදිසි අවශ්‍යතාවය . | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 71 | NPC/PP/01/CL-71/2024 | ඉදිකිරීම් කර්මාන්තය තුළ ඉහළයන ගිවිසුම්වලට අදාළ ආරවුල් විසඳීමට වහා මැදිහත් වන ලෙස ඉල්ලීම | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 72 | NPC/PP/01/CL-72/2024 | වන 3.6 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2022 අනු ඡේදය පිළිබඳව පැහැදිලි කිරීමක් ඉල්ලා සිටීම | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 73 | NPC/PP/01/CL-73/2024 | ප්‍රසම්පාදන සීමාවන් සංශෝදනය කරවා ගැනීම | මැතිවරණ කොමිෂන් සභාව |
| 74 | NPC/PP/01/CL-74/2024 | යෝජිත මෙ 100 .වෝ.සියඹලාණ්ඩුව සූර්ය බලාගාර ව්‍යාපෘතිය සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමේ ප්‍රසම්පාදනයට අදාළ උපදේශනය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් | සුනිත්‍ය බල ශක්ති අධිකාරිය |
| 75 | NPC/PP/01/CL-75/2024 | කොලොන්නාව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ වාත්තු වැඩපොලේ ප්‍රේරක උදුන් ඒකකයක් ස්ථාපනය කිරීම | රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව |
| 76 | NPC/PP/01/CL-76/2024 | ශ්‍රී ලංගම සඳහා නව ටයර් කට්ටල ප්‍රසම්පාදනය | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය |
| 77 | NPC/PP/01/CL-77/2024 | ශ්‍රී ලංකන් ගුවන් සේවය සීමිත කොටස් අලෙවිය පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා ගැනීමට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය | ජනාධිපති කාර්යාලය |

| | | | |
|---|---|---|---|
| 78 | NPC/PP/01/CL-78/2024 | රිජ්වේ ආර්යා ළමා රෝහලේ මහල් 9කින් යුත් ගොඩනැගිල්ලේ තීන්ත ආලේපයට අදාල ටෙන්ඩරය සුදුසුකම් නොලත් ඉදිකිරීම් ආයතනයකට ලබාදීමට කටයුතු කරමින් සිටීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 79 | NPC/PP/01/CL-79/2024 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රසම්පාදනයේ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා සහයෝගීතාවය ලබා දීම | රාජ්‍ය නොවන සංවිධාන |
| 80 | NPC/PP/01/CL-80/2024 | - 2022ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා වන මාර්ගෝපදේශවල වගන්ති සංශෝධනය කරන 6.5 සහ 3.5 ලෙස ඉල්ලා සිටීම | සෞඛ්‍ය අමාත්‍යාංශය |
